**වලල්ලාවිට ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය පකාශන 2013 අප්‍රේල් 11 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 01 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1:3:1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වීථි ලාම්පු ආධාර (1/72) ලෙජර ගිණුමේ ආරම්භක ශේෂය වූ රු.341,000 ක් හා අවසාන ශේෂය වූ රු.71,500 ක් සඳහා සාරාංශ ආදායම් ලේඛනය අනුව මුදල් ලැබීම් රු.939,500 ක් ගැලපීමෙන් පසු වර්ෂයේ බිල් කිරීම රු.670,000 ක් විය යුතු වුවද ආරම්භක ශේෂය රු.370,000 ක් ලෙස සටහන් කර සාවද්‍ය ලෙස බිල් කිරීම් වටිනාකම රු.848,000 ක් ලෙස ආදායම් හා වියදම් ගිණුමේ දක්වා තිබුණි.

(ආ) සාරාංශ ආදායම් ලේඛනය අනුව වැඩසටහන් අංක 5 හි කුලී ආදායම් රු.509,617 ක් වුවද ආදායම් හා වියදම් ගිණුමට රු.5,187,234 ක් ලෙස සටහන් කර තිබුණි.

(ඇ) සාරාංශ වියදම් ලේඛනය අනුව 201 වැය විෂයෙහි මුදල් ගෙවීම් රු.5,090,890 ක් සඳහා ණයහිමි ශේෂය රු.145,598 ක් ගැලපීමෙන් පසු වියදම රු.5,236,488 ක් වුවද, ආදායම් හා වියදම් ගිණුමට ණයහිමි ශේෂය වූ රු.145,598 ක් පමණක් සටහන් කර තිබුණි. මේ අනුව වර්ෂයේ වියදම රු.5,090,890 කින් අඩුවෙන් දැක්විණි.

(ඈ) 304 වැය විෂයයෙහි ණයහිමි ශේෂය රු.406,005 ක් වුවද, සාරාංශ වැය ලේඛනයට රු.412,630 ක් ලෙස සටහන් කර තිබුණි. මේ අනුව එම වැය විෂයට අදාල වර්ෂයේ වියදම රු.2,145,698 ක් විය යුතු වුවද, රු.2,152,323 ක් ලෙස ආදායම් හා වියදම් ගිණුමට ගිණුම් ගත කර තිබුණි.

(ඉ) පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ණය පදනම මත ලබා දී තිබූ රු.3,178,457 ක් වූ කැබ් රථයේ ණය මුදල ගිණුම් ගත කර නොතිබුණි. එම ණය මුදල වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් වැටුප් ප්‍රතිපූර්ණයෙන් අඩුකරගෙන තිබූ රු.655,825 ක් වූ වාරික මුදල වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම බැර කර වැය ගිණුම හර කළ යුතු වුවත් සභාව විසින් ප්‍රාග්ධන වත්කම් ණයගැති (වාහන) ලෙස ගිණුමකට බැර කර හිඟ හිටි වෙනත් ආදායම් ගිණුමට හර කර ප්‍රාග්ධන වත්කම් ණයගැති ලෙස දක්වා තිබූ බැර ශේෂය ශේෂ පිරික්සුමේ හරට සටහන් කර තිබුණි.

(ඊ) ප්‍රධාන ලෙජරය අනුව කර්මාන්ත ණයහිමි ගිණුමේ සහ අංක 04 මුදල් ගිණුමේ ශේෂයන් පිළිවෙලින් රු.115,319,299 ක් සහ රු.544,829 ක් වුවද ශේෂ පිරික්සුමේ පිළිවෙලින් රු.115,438,959 ක් හා රු.798,967 ක් ලෙස දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(උ) ඉකුත් වර්ෂයේ ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණු රු.31,250 ක් අප්‍රේල් මාසයේ ගෙවීම් කර තිබූ රු.164,032 ක් වූ ණයහිමි ගෙවීම් තුළ ඇතුළත් කර ණයහිමි ගිණුමට හර කර තිබීම නිසා එම වටිනාකමෙන් විවිධ ණයහිමි ශේෂය අඩුවෙන් දැක්විණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය රු.2,498,977 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම
-------------------------------------

(අ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම
-----------------------------------------------
අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 282,156,346 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් නොකිරීම
--------------------------------------------------
එකතුව රු. 31,253 ක් වූ ගෙවීම් වවුචර් 16 ක් 2014 සැප්තැම්බර් 18 දින දක්වා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,408,718 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,607,024 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------
සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| --- | --- | --- | --- | --- |
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 5,332 | 3,292 | 3,247 |
| (ii.) | බදු කුල | 10,476 | 9,383 | 811 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 5,400 | 133 | 6 |

2.3 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව යම් ආගමික, පුණ්‍ය, සංස්කෘතික, සෞඛ්‍ය, විනෝදාත්මක හෝ අධ්‍යාපන කාර්යයක් සම්බන්ධයෙන් එක් වර්ෂයකට මුළු එකතුව රු.1,000 කට වඩා වැඩි වන්නේ නම් ඒ සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ වෙසක් උත්සවය වෙනුවෙන් රු.87,216 ක් සහ සාහිත්‍ය උත්සවය වෙනුවෙන් රු.34,000 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ii) 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සභාපතිවරයාගේ නිවාස දුරකථනය වෙනුවෙන් මාසිකව රු.3,000 බැගින් රු.36,000 ක් ද, උප සභාපතිගේ ජංගම දුරකථනය වෙනුවෙන් මාසිකව රු.2,500 බැගින් රු.30,000 ක්ද අදාල දුරකථන බිල්පත් ලබාගැනීමෙන් තොරව ගෙවා තිබුණි.

(iii) සභාවේ අනුමත කළමනාකරණ සහකාර කාර්යය මණ්ඩලයේ කිසිදු ඌනතාවයක් නොතිබියදී 2013 අවසන් ගිණුම් පිළියෙල කිරීම හා අයවැය සකස් කිරීම වෙනුවෙන් රු.16,900 ක මුදලක් බාහිර පුද්ගලයෙකුට ගෙවා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) **<u>අත්තිකාරම් පියවීම</u>**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371(අ) අනුව කිසියම් කාර්යයක් සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදලක් එම කාර්යය නිම වූ වහාම පියවිය යුතු වුවද 2008 වර්ෂයේ සිට 2013 දක්වා ලබාදී තිබූ රු.233,940 ක් වූ අත්තිකාරම් විගණිත දිනය වූ 2014 සැප්තැම්බර් 18 වන විටත් පියවා නොතිබුණි.

(ආ) **<u>බැංකු සැසඳුම්</u>**

සභාවේ බැංකු ගිණුම් 3 ට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශ විගණිත දිනය වූ 2014 සැප්තැම්බර් 18 දින වන විටත් පිළියෙල කර තිබුණේ 2014 මාර්තු, මැයි හා ජූලි මාසයන් දක්වා පමණි.

(ඇ) **<u>ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්</u>**

මුදල් රෙගුලාසි 396(ඇ) අනුව 2013 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ ජංගම ගිණුම් දෙකකට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශනවල නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ රු.104,769 ක් වූ චෙක්පත් 29 ක් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) <u>සේවක ඇප</u>

ඇප තැබිය යුතු සේවකයින් 19 දෙනෙකුගෙන් ඇප මුදල් අය කර නොතිබුණි.

(ඉ) <u>සේවක ණය</u>

සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරු වී ගොස් තිබූ හා සේවය හැර ගොස් සිටි නිලධාරීන් 7 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ සේවක ණය රු.80,512 ක් විගණිත දිනය වූ 2014 සැප්තැම්බර් 18 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) <u>ගබඩා පාලනය</u>

2014 සැප්තැම්බර් 11 දින ගබඩා භාණ්ඩ නියදියක් සම්බන්ධයෙන් සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී තොග අයිතම 03 ක ඒකක 107 ක අතිරික්තයක්ද, තොග අයිතම 03 ක ඒකක 19 ක ඌනතාවයක්ද විය.

(උ) <u>හඳුනාගත් පාඩු</u>

සභාවේ තාවකාලික හා අනියම් සේවකයින් වෙනුවෙන් ගෙවනු ලබන සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් පිළිවෙලින් රු.39,566 ක් හා රු.24,863 ක් එම අරමුදල් වලට අධිභාර වශයෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඌ) <u>වාහන අනතුරු</u>

සභාවට අයත් කැබ් රථයක 2013 නොවැම්බර් 18 දින අනතුරකට ලක්ව තිබූ අතර වාහනයේ අළුත්වැඩියාව සඳහා රු.764,313 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 102 හා 104 විධිවිධාන ප්‍රකාරව අනුගමනය කලයුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(එ) <u>අවකරණ ප්‍රේෂණය</u>

සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තියන්ගේ භාර අරමුදල, විවිධ බැංක හා සංගම් වෙත ප්‍රේෂණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා සභාවේ සේවකයින්ගේ වැටුප්වලින් අවකරණය කර තිබූ රු.519,079 ක් හා සංගම් සහ වෙනත් සංවිධාන වෙත ප්‍රේෂණය කිරීම සඳහා 2013 අප්‍රේල් සිට මැයි දක්වා සභාවේ මන්ත්‍රීවරුන්ගේ දීමනාවෙන් අවකරණය කර තිබූ රු.32,800 ක මුදලක් ද වූ 2014 සැප්තැම්බර් මාසයේ විගණන අවස්ථාව වන විටත් අදාල ආයතන වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.

3.2 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(i) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය අතර තනතුරු 06 ක නිලධාරීන් 14 ක ඌනතාවයක් විය.

(ii) අනියම් පදනම මත බඳවාගෙන තිබූ මාර්ග කම්කරුවන් 06 දෙනෙක් සභාව විසින් සේවයේ යොදවා තිබුණි.

4. පද්ධති හා පාලන
-------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) වාහන උපයෝජනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඉ) සේවක මණ්ඩල කළමනාකරණය